
# අත්තම්මා පැවිදි වුණා



ඊ.ජී. නෙතුමි දිනුල්යා අබේරත්න

# අත්තම්මා පැවිදි වුණා

ඊ.ජී. නෙතුමි දිනුල්යා අබේරත්න
කතෘ

කතෘගේ වෙනත් කෘති
පූස් පැංචා

මහ/ මහාමායා බාලිකා විදුහල
5 ශ්‍රේණිය A

කෘතිය පළ කරන දිනය : 2026.05.10

ISBN :978-624-211-120-9

# පිදුම

මෙම පොත ලියන්නට මඟ පෙන් වූ මාගේ ආදර අම්මාටත්, අප්පච්චිට, මගේ කතාවේ වීරවරිය වන මාගේ ආදර අත්තම්මාටත්, මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමිය ඇතුලු සියලුම ගුරු පියවරුන්ටත්, ගුරු මෑණිවරුන්ටත්, මෙම පොත ආදරයෙන් පුද දෙමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන් වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණය ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණය ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ථ සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියළු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්.අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත,
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේ දී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධන වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළඳා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිළමේ,
ශ්‍රී දළඳා මාළිගාව
2026.05.10

මා කුඩා කාලයේ සිට රැක බලා ගත්තේ අපේ අත්තම්මායි. අත්තම්මාත්, අම්මාත්, අප්පච්චිත් සහ මමත් අප නිවසේ සතුටින් ජීවත් වුණා. මගේ අත්තම්මාගේ නම දයානි මානෙල් නවරත්න.

කුඩා කාලයේ මා හඬන විට අත්තම්මා නැළවිලි ගී කියමින් මා නැළෙව්වා. ඇයගේ නැළවිලි ගී අදටත් මට හොඳින් මතකයි.



මගේ අම්මාත්, අප්පච්චීත් උදෑසනින්ම රැකියාවට ගියවිට දවස පුරාම මා සිටින්නේ අත්තම්මා සමඟයි. මම උදෑසන අවදි වී හඬන විට අත්තම්මා දුවගෙන ඇවිත් මා වඩා ගනී. ඊට පස්සේ අත්තම්මා රසවත් කෑම සාදා මට කවා පොවා ආදරයෙන් රැක බලා ගත්තා.


අත්තම්මා මාව නාවා පිරිසිදු කර ලස්සන ඇඳුමක් අන්දවයි. අත්තම්මා මාත් සමඟ සෙල්ලම් බත් ඉවීම, බෝල ගැසීම, කෝම්පිට්ටු සෑදීම යන සෙල්ලම් ද කරයි.



මම හවසට අත්තම්මා සමඟ මල් වට්ටිය රැගෙන මල් කඩාගෙන ඇවිත් බුදුන් වැන්දා. අත්තම්මා මට ගාථා කියා දුන්නා. අත්තම්මා මට මෛත්‍රී භාවනාව කරන ආකාරය ද කියා දුන්නා. අත්තම්මා ලස්සන කතන්දරයක් කියමින් මට බත් කැව්වා. ජාතක කතා, රජ කතා, අන්දරේගේ කතා ද කියා දුන්නා. මම හැමදාම නින්දට යන්නේ අත්තම්මාට වැඳලයි.



දවසක්දා මිදුලේ අඹ ගහ යට බංකුවේ අත්තම්මාත්, මමත් හිඳගෙන සිටිය දී ඈත කඳු මුදුනේ ගහක කුරුල්ලන් පිරිසක් සිටිනවා දුටුවා. සමහර කුරුල්ලන් කුරුලු කූඩු සාදයි. තනි තනිවම සිටි, රංචුව වශයෙන් සිටියි. කුරුල්ලන්ගේ සමගිකම එකමුතුකම ගැන අත්තම්මා මට කියා දුන්නා. අත්තම්මා මට නිතරම අවට පරිසරයේ තිබෙන ගහකොළ, සත්තුත් ගැන කියා දුන්නා.



දවසක් දා  අපි අඹ ගහ යට බංකුවේ වාඩි වී සිටින විට අපි දුටුවා අර ගසේ කොළ සියල්ලම හැලී තිබෙන බව එවිට ගසේ තිබුණු කුරුලු කූඩු අපට හොඳින් පෙනුණා. මම අත්තම්මාගෙන් ඇහුවා. "අනේ අත්තම්මේ අපේ ගහට මොකද මේ වෙලා තියෙන්නේ" කියලා එතකොට අත්තම්මා මට කියා දුන්නා එක් කාලයකට ගස්වල කොළ හැලී ගිහින් නැවත දළු දා වැඩනවා කියලා.



අත්තම්මාට මට අහස ගැන ද කියා දුන්නා. අහසේ තිබෙන වලාකුළු සහ ඒවා පාවී යන ආකාරය දෙස අපි ඉතා ආසාවෙන් බලා සිටියා. අහස අඳුරු වී සුළඟත් සමඟ වැස්ස වහින විට අවට පරිසරය හරිම ලස්සනයි. අත්තම්මා මට කඩදාසි බෝට්ටු සාදා දුන්නා. අපි ඒවා ගලාගෙන යන දිය පාරට දැමුවා. සමහර බෝට්ටු දිය පාරේ ඈතටම ගියා. සමහර ඒවා මග නැවතුණා.



මම සතුන්ට ආදරය කිරීමට ද ඉගෙන ගත්තේ අත්තම්මාගෙනි. මිදුලේ තිබෙන අඹ ගහේ කෑම ලෑල්ලට අත්තම්මා උදෙන්ම බත් හැන්දක් දමනවා. බත් කන්න දෙමලිච්චෝ, මයිනෝ, ලේනෝ සහ ගිරවු යන සතුන් ද එනවා. ලේනා කෑම ලෑල්ලට එනවිට බත් කමින් සිටින මයිනෙක් කොටයි. ලේනා ඉක්මණින් ගුලියක් අරගෙන අඹ ගසේ ඉහළ අත්තකට වී බත් ගුලිය අතින් අල්ලාගෙන කයි. අපි සත්තුන්ට බීමට සහ නෑමට වතුර බේසමක් ද මිදුලේ තැබුවා.




මම පෙර පාසල් ගියෙත් අත්තම්මා සමඟයි. අත්තම්මා මගේ අතින් අල්ලාගෙන පාරේ දකුණු පැත්තෙන් ගමන් කළා. ඒ යන අතරතුර ඇලේ සිටින මාළුන්ට කෑම දැමීමට ද අපි අමතක කළේ නැහැ.



මා පෙර පාසල් ගිහින් පාසලට භාර දෙන විටත්, අත්තම්මා හිටියා, එදා දවස අත්තම්මාට ඉතා සතුටු දවසක් බව පැවසුවා. එදා සිට අත්තම්මා මගේ පාසල් වැඩ වලට ද උදව් වුණා. අත්තම්මා බණ ඇසිමට, භාවනා කිරීමට ඉතා කැමතියි. එම නිසා අත්තම්මා දවස් කිහිපයක්ම නැවති භාවනා වැඩසටහන් වලට සහභාගි වුණා. අන්තිමේ දී අත්තම්මා කුලියාපිටිය ඉසිපතනාරාමයේ නැවතී භාවනා කළා.



දවසක් දා අම්මාට දුරකථන ඇමතුමක් ආවා. ඉන්පසු අම්මා හඬමින් කීවේ අත්තම්මා පැවිදි වන බවයි.අපි එදා උදෑසනින්ම ආරාමයට ගියා. අත්තම්මා මුලින්ම සුදු ඇඳුමෙන් සැරසී සිටියා. මාව ආදරයෙන් වැළඳගෙන සිපගත්තා. ඉන්පසු මෙහෙණින් වහන්සේලා විසින් අත්තම්මාගේ සුදු කොණ්ඩය කපා ගාථා කියමින් සිවුරු අතින් තැබුවා. ඉන්පසු මා දුටුවේ මුතු කුඩය යටින් සිවුරු ඇඳගෙන වඩින අත්තම්මයි. මං අත්තම්මා හදක් වගේ ලස්සනට දැක්කා.



අපේ ගෙදර මට අත්තම්මා නැති අඩුව හොඳටම දැනුනා. මං අත්තමාගේ කාමරයට ගියා. අත්තම්මාගේ ඇදේ වාඩි වුණා. අත්තම්මාගේ සුවඳ මට තාමත් දැනෙනවා. මං අත්තම්මාගේ ගවුමක් අතට අරන් සුවඳ බැලුවා. මගේ ඇස් වලට කඳුලුත් ආවා.



අපි අත්තම්මා බලන්න උදෙන්ම දානෙත් උයාගෙන පන්සලට ගියා. අත්තම්මා අපි දැකලා හරියට සතුටු වුණා. අපි දානේ පිළිගැන්නුවා. අත්තම්මා අපිට බණ කිව්වා.

අපි දැන් පෝයට සිල්ගන්න පන්සලට යනවා. පසුගිය වෙසක් පෝයට අපි අත්තම්මා ගමේ පන්සලට වඩම්මලා ධර්ම දේශනයක් පැවැත්වූවා. අත්තම්මා ධර්ම ශාලාවේ තිබුණ ආසනයේ වාඩිවෙලා බණ කිව්වා. ඊට පස්සේ බණ අහපු ගමේ නැන්දලා, මාමලා, අත්තම්මාට පිරිකර පූජා කළා. අත්තම්මාගේ නමත් දැන් වෙනස් වෙලා. මගේ අත්තම්මාට දැන් කියන්නේ හේවාවිස්සේ ධම්ම සුධීපා මෙහෙණින් වහන්සේ කියලයි. මගේ අත්තම්මාට දළදා සමිඳු පිහිටයි.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින් උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂ්‍යකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාලන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලුදෙනාටද, දියවඩන නිලමතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)